**අන්තර්ජාලය හරහා ඔබගේ තේරීම් ලිපිය බාගත කර ගැනීමට හා අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ ලියාපදිංචිවීම සඳහා යොමුවීමට උපදෙස්**
**2020/2021 අධ්‍යයන වර්ෂය**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට (www.ugc.ac.lk) පිවිසෙන්න.
2. දැනටමත් ඔබ සතුව තේරීම් ලිපිය, උපලේඛනය දැක්වෙන ඇමුණුම් අංක 1 සහ අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය උපදෙස් දැක්වෙන ඇමුණුම් අංක 2 පවතී නම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි "Online Registrations" කොටුවෙහි ඇති "For directly proceed to registration" දිගුව "click" කරන්න.
3. ඔබ සතුව තේරීම් ලිපිය සහ/හෝ ඉහත අනෙකුත් ලියකියවිලි නොමැති නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි "Online Registrations" කොටුවෙහි ඇති "To download the Letter of Selection & proceed to registration" දිගුව "click" කරන්න.

**ඔබ "For directly proceed to registration" දිගුව භාවිත කලේ නම්;**

1. දැනටමත් ඔබ බාගත කරගෙන ඇති අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය උපදෙස් දැක්වෙන ඇමුණුම් අංක 2 හි ඇති උපදෙස් අනුව කටයුතු කරන්න.

**ඔබ "To download the Letter of Selection & proceed to registration" දිගුව භාවිත කලේ නම්;**

1. ඔබට "Login" පිටුව දිස් වනු ඇත.
   i. මෙහි ඔබ විසින් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමට සාදාගත් ගිණුමෙහි පරිශීලක අංකය (User ID) සහ මුරපදය (Password) යොදන්න. ඔබගේ පරිශීලක අංකය වන්නේ ඔබ විසින් ගිණුම සෑදීමට යොදාගත් ඊමේල් ලිපිනයයි. ඔබට මුරපදය අමතක වී ඇති නම් "Forgot Password" දිගුව භාවිත කර මුරපදය වෙනස් කරගත හැකිය.
   ii. දැන් "Login" බොත්තම ඔබන්න.
2. දැන් ඔබට "Verify Your Identity" පිටුව දිස්වනු ඇත.
   i. මෙහි "Your NIC" කොටුවෙහි ඔබ විසින් අන්තර්ජාල විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඇතුළත් කරන ලද ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකයෙහි මුල් ඉලක්කම් කිහිපය දිස්වනු ඇත. එහි ඉතිරි ඉලක්කම් සහ තිබේනම් ඉංග්‍රීසි අකුර සම්පූර්ණ කරන්න. (ඔබ විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ජාතික හැඳුනුම්පත් අංකයක් ඇතුළත් නොකරන ලද්දේ නම්, ජාතික හැඳුනුම්පත් අංකයෙහි ඉතිරි ඉලක්කම් සහ ඉංග්‍රීසි අකුරු සම්පූර්ණ කිරීමේ මෙම කොටස ඔබට දිස් නොවනු ඇත).
   ii. "Your Mobile Number" කොටුවෙහි ඔබ විසින් අන්තර්ජාල විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඇතුළත් කරන ලද ඔබගේ ජංගම දුරකතන අංකයෙහි මුල් ඉලක්කම් හය දිස්වනු ඇත. එහි ඉතිරි ඉලක්කම් හතර සම්පූර්ණ කරන්න.
   iii. "Your Email Address"කොටුවෙහි, ඔබ විසින් අන්තර්ජාල හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමට සාදාගත් ගිණුම සෑදීමට යොදාගත් ඊමේල් ලිපිනය දැක්වෙනු ඇත.

**සැලකිය යුතුය:** **යම් හෙයකින්, ඔබගේ ඉහත සඳහන් ජංගම දුරකතනය හෝ ඊමේල් ගිණුම මේ වනවිට භාවිතයේ නොමැති/අක්‍රීය නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවියෙහි සඳහන්ව ඇති දුරකතන අංක හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශය අමතන්න.**

   iv. දැන්, "Submit"බොත්තම ඔබන්න.
3. දැන් ඔබට "OTP Verification" පිටුව දිස්වනු ඇත. ඒ හා සමඟම "Please click on the link sent to your email.Once you click on the link, an OTP will be sent to your mobile number" යන පණිවිඩය ද පිටුවේ දකුණු පසින් දිස්වනු ඇත.
4. එම පණිවිඩයේ සඳහන් පරිදි ඊමේල් ගිණුමට යොමු කරන ලද දිගුව "click" කිරීම සඳහා ඉහත 2(iii) හි දැක්වුන ඊමේල් ගිණුමට ඇතුලු (log) වන්න.
5. එම ඊමේල් ගිණුමෙහි "Inbox" වෙත විශ්වවිද්‍යාල ප්‍රවේශ දෙපාර්තමේන්තුවෙන් යොමු කර ඇති ඊමේල් පණිවිඩය දැන් ඔබට දිස් වනු ඇත. එහි "Please click here to generate otp" යන දිගුව "click" කරන්න.
6. එම දිගුව "click" කළ පසුව ඔබ විසින් ඉහත 2(ii) හි සම්පූර්ණ කරන ලද ජංගම දුරකතන අංකයට OTP කේතයක් යොමු කෙරෙනු ඇත. එම OTP කේතය ඉහත 3 හි සඳහන් "OTP Verification" පිටුවෙහි ඇති "SMS Code"කොටුවට ඇතුළත් කර "Submit"බොත්තම ඔබන්න.
7. දැන් ඔබට "Selection Letters" පිටුව දිස්වනු ඇත.
8. "Selection Letters" පිටුවෙහි දැනට ලියාපදිංචිය සඳහා විවෘතව ඇති ඔබ තේරී පත්වූ පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට අදාළ තොරතුරු, එම තේරී පත්වීමට අදාළ තේරීම් ලිපිය සහ එම තේරී පත්වීමට සහ ලියාපදිංචියට අදාළ අනෙකුත් ලියකියවිලි තනි ගොනුවක් (file) සේ බාගත කරගත හැකි දිගුව දිස් වනු ඇත. එම දිගුව භාවිත කරමින්, අදාළ තේරීම් ලිපිය සහ අදාළ අනෙකුත් ලියකියවිලි බාගත කරගන්න.

**සැලකිය යුතුය:** **යම් හෙයකින්, ඔබ තේරීම් ලිපිය ඇතුලු අනෙකුත් ලියකියවිලි බාගත කිරීමට පෙර පද්ධතියෙන් ඉවත් වුවහොත් (log out) ඒවා බාගත කරගැනීම සඳහා ඉහත 7 හි සඳහන්** "Selection Letters" **පිටුවට නැවත පිවිසීමට පෙර ඉහත 1 සිට 6 දක්වා වූ පියවර නැවත අනුගමනය කිරීමට සිදුවන බව සලකන්න.**

**ඒ වෙනුවට, ඔබ එම තේරීම් ලිපිය ඇතුළු අනෙකුත් ලියකියවිලි බාගත කරගෙන පසුව ලියාපදිංචිය සම්පූර්ණ කිරීමේ අදහසින් පද්ධතියෙන් ඉවත් වුවහොත් ඉහත 1 සිට 6 දක්වා වූ පියවර නැවත අනුගමනය කිරීම අවශ්‍යය නොවන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි "Online Registrations" කොටුවෙහි ඇති "For directly proceed to registration" දිගුව භාවිතයෙන් අන්තර්ජාලය හරහා ලියාපදිංචි වීමේ පද්ධතියට කෙලින්ම යොමු විය හැකි බව සලකන්න.**

9. දැන්, තේරීම් ලිපියෙහි සහ බාගත කරගත් අනෙකුත් ලියකියවිලිවල සඳහන් තොරතුරු සහ උපදෙස් හොඳින් කියවන්න.
10. දැන් තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමට "Selection Letters" පිටුවෙහි ඇති "Click here to go to the Registration System" බොත්තම ඔබන්න.
11. දැන් ඔබ ඉහත 8 හි බාගත කරගත් අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය උපදෙස් දැක්වෙන ඇමුණුම් අංක 2 හි සඳහන් උපදෙස් අනුගමනය කරමින් අන්තර්ජාලය හරහා තේරී පත්වූ පාඨමාලාවේ හා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිය සම්පූර්ණ කරන්න.

**Instructions to download your Letter of Selection and to proceed to the online registration for the course of study of the university selectedAcademic Year 2020/2021**

1. Go to the official website of the UGC (www.ugc.ac.lk).
2. If you have already downloaded the Letter of Selection, the Schedule named Annex I and the Instructions to register online for the selected course of study and the university named Annex II, you may click on the To directly proceed to registration link given in the Online Registrations box on the official website of the UGC.
3. If you have not already downloaded the Letter of Selection and/or other documents specified above, you may click on the To download the Letter of Selection & proceed to registration link given in the Online Registrations box on the official website of the UGC.

**If you had clicked on To directly proceed to registration link;**

1. Follow the instructions given in the already downloaded Annex II on Instructions to register online for the selected course of study and the university.

**If you had clicked on To download the Letter of Selection & proceed to registration link;**

1. You will be displayed the Login window.
   i. Enter the UserID and the Password of your account created for completing the online application for university admission. Your UserID is the email address used by you to create the account. If you have forgotten the password, you can change your password using the Forgot Password link.
   ii. Now click on the Login button.
2. Now you will be displayed the Verify Your Identity window.
   i. In the Your NIC cage, the first few numbers of your NIC entered by you in the online application for university admission will be displayed. Fill in rest of the numbers and the English letter if any. (If you have not provided any NIC in the application for university admission, this option to fill in rest of the numbers and the English letter of NIC will not be displayed to you).
   ii. In the Your Mobile Number cage, the first six digits of the mobile number entered by you in the online application for university admission will be displayed. Complete rest of the four digits.
   iii. In the Your Email Address cage, the email address used by you to create the account to fill in the online application for university admission will be displayed.

Note: **In case, if your above stated mobile number or the email address is currently not in use/out of service, you may contact the Department of University Admissions via the telephone numbers given in the official website of the UGC.**

   iv. Now press the Submit button.
3. Now you will be displayed the OTP Verification page. Along with that, the message “Please click on the link sent to your email. Once youclick on the link, an OTP will be sent to your mobile number” will also be displayed in the right side of the page.
4. In order to click on the link sent to your email account as instructed in the message, log on to the email account given in above 2(iii).
5. You will now be seen the email sent by the Department of University Admissions to the inbox of that email account. Click on the Please clickhere to generate otp link.
6. After you click on that link, an OTP will be sent to the mobile number completed by you in above 2(ii). Enter that OTP into the SMS Code textbox of the OTP Verification page stated in above 3 and press the Submit button.
7. Now you will be displayed the Selection Letters page.
8. In the Selection Letters page, the details on the course of study of the university to which you have been selected and available for registration, the link to download the letter of selection of the same and other documents related to that selection and the registration as a single file will be displayed. Get the letter of selection and other documents downloaded using that link.

Note: **In case, if you have logged out from the system prior to get the letter of selection and other documents downloaded, note that youwill have to refollow the steps 1 to 6 above before visiting the Selection Letters page stated in above 7, for downloading them.**

**Instead, if you have logged out from the system with the intention of completing the registration later on after getting the letter of selection and other documents downloaded, you can directly proceed to the online registration system by clicking on the To directly proceed to registration link in the Online Registrations box on the official website of the UGC, without requiring to refollowing the steps 1 to 6 above.**

9. Now, read the information and instructions given in the Letter of Selection and other documents downloaded.
10. Now, press the Click here to go to the Registration System button in the Selection Letters page to get registered for the course of study of the university online.
11. Now, complete your online rgistration to the course of study of the university selected following the instructions given in the Annex II on Instructions to register online for the selected course of study and the university, already downloaded in above 8.